


"sUBHA Aluth aVURUDDAK ! " පන්හිඳ මොනවදෝ පරිඝණක යතුරු පුවරුවෙන් යතුරු ලියනය කළා.

"ෂික් ! "කැප්ස ලොක්" වෙලානෙ !! ආයෙත් මුල හිටන් "ටයිප්" කරන්න වෙනවා. ඇත්තටම මෙහෙම වුණාම ආයෙ "ටයිප්" නොකර වැරැද්ද හදාගන්න විදියක් මේ "කොම්පියුටර්" හදපු අයට හොයා ගන්න බැරිවුණාද ?

"Subha Aluth Avuruddak ! " පන් වැරැද්ද හරිගස්සලා "සිංග්‍රීසියෙන්" යතුරු ලියනය කළා.

"තමුන්නැහේ ඉතින් කොයිවේලෙත් "කැප්ස් ලොක්" කරගත්ත ගමන්නේ ! හොඳ වැඩේ "සිංග්-ලිෂ්" වලින් "විෂ්" කරන්න ගියාට. මේක සිංහල අළුත් අවුරුද්ද ! තේරුණාද ? සිංහලෙන් සුභපැතුවනම්නෙ හොඳ ! පින්සල හිනාවුණා.

"මොනවා කරන්නද පින් ? මා ළඟ සිංහල " ෆොන්ට්ස්" නෑ. තිබුණත් "ටයිප්" කරන්න දන්නෑ. දැන්වත් හොයාගෙන පුරුදු වෙන්න ඕනෙ."

"ඔව් ඉතින් යන තැනකටවත් වැඩක් වෙන්න, මේ නහින දෙහින කාලේ හරි කමක් නෑ...."

"මොනවා වුණත් "සුභ අළුත් අවුරුද්දක් !" කියලා හැමෝටම සුභපතනවා. පහුගියදාක මට මුණගැහුණනේ අපේ එස්. කරුණාරත්න මහත්තැන්ව. අපිට මාතෘකාව වුණේ අවුරුද්ද. හරියට අවුරුද්දට ගමේ ගියා වාගේ උන්නැහෙ එක්ක අල්ලාප සල්ලාපයේ යෙදුන ඒ පැය කීපය." පන් පරිඝණකය වහලා ලියන මේසයට මාරු වුණා.

හැටේ දශකයේදී ශ්‍රී ලංකාවේ නාට්‍ය ක්ෂේත්‍රයේ කැපී පෙනෙන ස්ථානයක් හොබවමින් සිය කලා මං පෙතට පිළිපන්, එතැන් පටන් අද දක්වා ම එම ක්ෂේත්‍රයේ සජීවී ලෙස නාට්‍ය රචනය, නිශ්පාදනය, පරිවර්තනය, මෙන් ම රංගනයෙන් ද දායක වූ එස්. කරුණාරත්න නම් වූ නාට්‍ය ශිල්පියා නිවාඩුවක් ගත කිරීම සඳහා මේ දිනවල මෙල්බර්න් නුවරට පැමිණ සිටියි. එළැඹෙන සිංහල අළුත් අවුරුද්ද වෙනුවෙන් එතුමන් හා කතිකාවතකට මුල පුරනු වස් වසර 1964 ශ්‍රී ලංකාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව පැවැත්වීමට යෙදුණ නාට්‍ය උත්සවයේ ආරාධිත නාට්‍යයක් වූ එතුමන්ගේ නාට්‍යයක් වූ "එරබදු මල් පොට්ටු පිපිලා" නාට්‍යයේ ආරම්භක ගීය මෙලෙසින් සිහිපත් කරන්නෙමු;

"එරබදු මල් හිනාවුනා. එරබදු මල් හිනාවුනා.

සොමි ගුණ සඳ රැසින් රැගෙන
හිරු දෙව්ඳුගෙ රන් පැහැ ගෙන
හදවත් හැම එඩිගන්වන
එරබදු මල් හිනාවුනා. "

"ඒ හිනාව නුබ නැගුනා
නුඹ ගැබ රත් පැහැ ගැනුනා
රතින් රුහිරු බිඳු සැදුනා
එරබදු මල් හිනාවුනා. "

"එදා නාඹර වියේ තරුණයෙකුව සිටියදී, නාට්‍යකරුවකු වශයෙන් මා සිංහල අවුරුද්ද දුටුවේ ඒ විදියටයි..." "එස් . කරු" මහත්මා කතාවට මුල පිරිවා. ඒ කාලයේ මා තුල වූ තරුණ මදයෙන් මේ පදවැලට දේශපාලන දර්ශනයක් ද මා ඇතුලත් කළා..."

"අපේ නිජ භූමියෙන් සැතපුම් දහස් ගණනක් ඈත ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවරට මා පැමිණි ප්‍රථම වතාව මෙය නොවෙයි. අපට තරම් දිගු, සංකීර්ණ හරබර ඉතිහාසයක් නැති වුණත් බහු සංස්කෘතික රටක් වූ ඔස්ට්‍රේලියාවෙන් අපට ලබාගත හැකි ආදර්ශ, පාඩම් අනන්තයි; අප්‍රමාණයි." එස් . කරු මහත්මයාගේ ඒ කතාව දැකලා පන්ට මෙහේ දුම්රිය පළකදී දැක්ක ප්‍රචාරක දැන්වීමක් මතක් වුණා....

"248 Countries

# එරබදු මල් හිනාවෙන්න !

289 Languages
128 Faiths
1 Nation "

"මේ රටේ ජීවත් වන අපේ ශ්‍රී ලාංකික සම්භවයක් ඇත්තන්ගේ පැවැත්ම හා සමඟ අපේ සිංහල අවුරුද්ද බද්ධ කරන්න මා කැමති. අවුරුදු දෙකක කාලය තුල මෙහි පවත්වන ලද අවුරුදු උත්සව දෙකකට මා සහභාගී වී තිබෙනවා. මට විවෘතව යමක් කියන්න ඕන.

ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් දුප්පත් රටක්. ඒත් සංකල්පය හා ආකල්පමය වශයෙන් ලෝකයේ කිසිම රටකට නොදෙවෙනි රටක් අපේ මව් රට. අන්න ඒ නිසයි තාමත් ශ්‍රී ලාංකිකයෝ චක් ගුඩු, පොර පොල්, අං ඇදීම, ගස් දෙක තැනීම, තාච්චි පැනීම වැනි සමාජ ක්‍රීඩා වගේම ගෘහස්ත ක්‍රීඩා වන පංච කෙළි, වල කජු, දාං පෙත යනාදි ක්‍රීඩාවල යෙදෙන්නේ. අවුරුදු දිනට, එම කාලයට පමණක් සීමාවෙන මෙවැනි ක්‍රීඩා මගින් ගම්වාසීන්ගේ, අසල්වැසියන්ගේ එකමුතුකම හා සහජීවනය, ප්‍රතිමූර්තිමත් වෙනවා. අපේ සංස්කෘතිය ජන ජීවිතය හා බැඳී පවතින සංස්කෘතියක් !"

"ඒක ඇත්ත ! කොහොම ද මේ රටේ ජීවත්වන සිංහල අයගේ ජීවන රටාවත් එක්ක ඒ සංස්කෘතික අංග, චාරිත්‍ර වාරිත්‍ර බද්ධ කරගන්නෙ" පන්ගෙන් ප්‍රශ්ණයක්.

"මං කිව්වානේ මේ රටේ පැවැත්වුණ සිංහල අවුරුදු උත්සව දෙකකට මා සහභාගි වුණ බව. ඇත්තටම එය සංවිධානය කරපු උදවිය කෙතරම් වෙහෙස ගන්නට ඇද්ද කියලා මට හිතාගන්න පුළුවන්. සැබැවින්ම ප්‍රශංසනීයයි ඒ උත්සාහයත්. ඒවායේ අඩුපාඩු නැතුවා නොවෙයි. ඒත් ගෘහස්ථ වශයෙන් කෙරෙන අපේ සම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර මෙරට වෙසෙන අපේ සිංහල පවුල්වලට ක්‍රියාත්මක කළ නො හැකි ද ? විශේෂයෙන්ම ලිප ගිනි දැල්වීම, වැඩ ඇල්ලීම, ගනු-දෙනු



කිරීම, වැඩිහිටියන්ට ආචාර සමාචාර කිරීම, අසල්වැසියනට කෑම පිඟානක් යැවීම වැනි විශේෂාංගයන් සැම ගෘහයකම පැවැත්වුවහොත් එය කෙතරම් අපූරුද ? වැඩිහිටියන්ගේ මෙම ආදර්ශ පූර්වක ක්‍රියාදාමයන් දරුවන්ගේ මනස තුලද සටහන් වීම නිසා ඒවායේ අපූරවත්වය ළමා මනස තුල පැලපදියම් වනු නො අනුමානයි. අපේ සංස්කෘතික ලක්‍ෂණයන් නිසා ආගන්තුක රටක හැදෙන අපේ අනාගත පරපුරට අත්වෙන්නේ දීර්ඝකාලීන යහපතක්. ඒක සුළුපටු දෙයක් නොවෙයි."

"ඇත්ත වහයෙන්ම අපේ අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලින්, අපේ සිංහල සිරිත් විරිත්වලින් වැඩි ක්‍රියාකාරකම් රැසක් ඇති බව අපිට පසක් වෙනවා. දෙමාපියන්, දරුවන්, සහෝදර සහෝදරියන් නෑදෑ හිතවතුන් වසරකට වරක් හෝ එකතුවන්නේ, සතුටු සාමීචියේ යෙදෙන්නේ මේ වාගේ අවස්ථාවකදී යි. වැඩිහිටියන්ට ගරු කිරීම, සහෝදර සහෝදරියන් අතර නිකැළල් සහසම්බන්ධතාවය, නිහතමානීත්වය වැනි ගුණධර්ම දරුවන් තුල පැලපදියම් වෙනවා. මගේ අත් දැකීම් අනුව අපේ රටෙන් මෙහි පැමිණ ජීවත් වන අයගේ මෙහි උපන් දරුවන්ගේ තත්ත්වය පිළිබඳව මට ඇතිවන්නේ භීතියක් ! මා කතා කරන්නේ සියළුම දරුවන් පිළිබඳව නොවන බවත් විශේෂයෙන්ම සඳහන් කරන්න සිද්ධ වෙනවා. මා කී බාල, තරුණ දෙකොටස ම මේ රටේ පසුවෙන්නේ ගන්ධබ්බ අවස්ථාවක. ඔවුන් සංස්කෘතීන් දෙකක අතරමං වෙලා. මෙහිදී වගකීම පැවරෙන්නේ මෙරට අධ්‍යාපන ක්‍රමයටම, හැදියාවට ම නොවන බවයි මගේ වැටහීම. අපේ දෙමව්පියන්ගේ කරපිට පැවරෙන්නේ සුළුපටු වගකීමක් නොවන බව අපි තරයේම වටහා ගත යුතුයි. ගමේ ගොඩේ, වෙල් ඉපනැල්ලේ කොස් දෙල් කා හැදුන අපට අපේ දරුවන් හික්මවීමේ වගකීම පැවරිලා තියෙනවා. ඒ වගකීම පැහැර හැරියොත් එය දරුවන්ගෙ වරද නොවෙයි."

"සර්ව පිත්තල සංස්කෘතියත් අපගේ හරබර නිර්මල සංස්කෘතියත් අතර ගන්ධබ්බ වෙලා තියෙන්නේ දරුවන් පමණක් නොවෙයි. මේ මට ඇහුණ කතාවක්;

"ඒකනං ඇත්ත අයියෝ, අපේ ලොක්කිට ලංකාවේ අපේ මහගෙදර මතක් කරනකොට නයාට අඳුකොල වගේ.... එයා කියනවා.... අයියෝ මම් අයි හේට් දැට් ප්ලේස්..... පුටුවල මකුණෝ, රෑට මදුරුවෝ, පාරෙ මඩ වලවල්...."

මේ දේ මා දකින්නේ එක්තරා සමාජ විද්‍යාත්මක දෘෂ්ඨියකින්. අවුරුදු හතළියකට පමණ පෙර මෙරටට සංක්‍රමණය වන්නට පටන් ගත් ශ්‍රී ලාංකික පවුල් මේ ප්‍රවාහයට හසු වී ඇති බවයි ඉතා සියුම් ලෙස ඔවුන්ගේ වත්මන් ක්‍රියා කලාපයන් විශ්ලේෂනය කිරීමේදී අපට පෙනෙන්නේ." කරු මහත්මා කීය.

සැබැවින් ම එකල මෙරටට සංක්‍රමණය වූවනට සිංහල හා මුහුවන්නට පරිසරයක් නො තිබිණ. ඔවුන්ගේ එකම පරිසරය වූයේ ඉංග්‍රීසි පරිසරයයි. මේ වන විට එය සුභවාදී ලෙස පරිවර්තනය වෙමින් පවතියි. හෙළ බස මතු නොව හෙළ කලාවන් සහ සංස්කෘතිකාංග මෙන්ම මාධ්‍යයන් ද ආගමිකස්ථාන ද ඊට මහත් වූ රුකුලක් වෙයි. ඒ ඇසුරින් අප වෙතින් ගිළිහී යාමට අර අදින චාරිත්‍ර වාරිත්‍ර ද ක්‍රමයෙන් අපගේ මතු පරපුරට හඳුන්වා දීම කාලීන අවශ්‍යතාවයකි. "එස්. කරු" මහත්මාට අනුව;

"සරුවපිත්තල ආකල්පමය පිරුවටයෙන් මිදිය යුතු කාලය එළඹ ඇති බවයි මගේ හැඟීම. සිංහල අවුරුදු ලබන මේ මොහොතේ මේ ව්‍යසනයෙන් මිදීමට එය හොඳම නිමිත්තක් කරගත යුතුයි."

"එරබදු මල් සිංහල අවුරුද්ද සංකේතවත් කරන බැද්දේ පිපෙන රතුපාට මලක්. ඉදිරි අනාගතයේ දී අපේ පරපුරට එරබදු මල් පොට්ටු පිපී විහිදෙන අනාගතයක් වේවා ! යි ප්‍රාර්ථනා කරනවා." එස් කරු මහත්මයා කතිකාවත නිමා කළේය.

පන් ඉපදුණ කාලයේ ලියැවුණ පදපෙලකින් ලිපිය පටන් ගත් නිසා මෑතකදී ලයනල් රන්වල ජන ගී කණ්ඩායම නිකුත් කරපු "පුංචි අයට ජනන ගී" ළමා ගීත එකතුවට ලියවුණ අවුරුදු ගීයකින් ලිපිය ඉවර කරන්න පන් හිතුවා.

කුන්ද හට්ටි ටික ළඟට අරන්
කොන්ද නවාගෙන මන්ද බොලන් ?
කුන්ද කුන්ද කදු නැන්දෙ ඉතින්
කොන්ද තවන්නට වෙයි ද බොලන් ?
සිංහල අවුරුදු ළඟ එනවා - නැන්දම්මේ !
කුල්ලක් හුළඟේ හාල් පොලන්නා
වංගෙඩියක් ළඟ මෝල් නටන්නා
කුරහන් ගලවට පිටි ඇඹරෙන්නා
ලිප් ගල් ගොම මැටියෙන් හැඩවෙන්නා
කැවිලි හදන්නට අපි දන්නැතිවා - නැන්දම්මේ !
පුංචි කොකිස් මල් තෙලේ පිපෙන් නා
කොණ්ඩ කැවුම් පොඩි ඔමරි කරන්නා
බලං ඉන්න බැරි අය නළියන් නා
හැන්ද උළුක් කර නැන්දා රවන් නා
කැවිලි ගනින්නට නෑ ගම් එන්නම් - අවුරුද්දේ !

සිසිර දිසානායක




